" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

Chief Secretary } Telephone 011 - 2092599, Fax 011 - 2092601, E mail - chiefsecretary@wpc.gov.lk

General Telephone } 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC 17021 QMS-001-01

| My No } CSWP/ADM/30-38/FI/01 | Your No } | Date } 2024 .01. 20 |
|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.01.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ 3/2020(I) | වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 02. | 2023.12.22<br>රා.ප.චක්‍රලේඛ 26/2023 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන් සඳහා සහනයක් ලබාදීම. |
| 03. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ ලිපි 02/2023 | දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 04. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ 23/2023 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයින් සඳහා නිවාඩු ලබාදීම. 2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්. |
| 05. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ ලිපි 04/2023 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උපවගන්තියට අදාළ වන දඬුවමක් ඇතුළත් විනය නියෝගයකදී වැටුප් වර්ධක අඩුකිරීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය. |

| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel 0112092636<br>Fax 0112092635 | Tel 0112092631<br>Fax 0112092647 | Tel 0112092640<br>Fax 0112092636 | Tel 0112092532<br>Fax 0112092533 | Tel 0112092301<br>Fax 0112092305 | Tel 0112092028<br>Fax 0112092025 |

| | | |
|---|---|---|
| 06. | 2023.12.18<br>රා.ප.චක්‍රලේඛ 24/2023 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2023.12.31 |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 3/2020 (I)

මගේ අංකය : Pns/P4/W&OP/CONT-FEE/SUB-I
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2023.12.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම

උක්ත මැයෙන් 2020.12.31 දිනැතිව නිකුත් කරන ලද අංක 3/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/23/2097/605/067 හා 2023.11.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2020 හි විධිවිධාන පරිදි පෙර වර්ෂයන් සඳහා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක වීම පිළිබඳ විස්තර සම්පූර්ණ කිරීමට ලබා දී ඇති සහන කාලය 2022.12.31 දින වන විට අවසන් වී ඇති බැවින් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයවීම් පිළිබඳව පැරණි තොරතුරු සොයා යාමේ දී රාජ්‍ය නිලධරයන්ට මුහුණ දීමට සිදු වී ඇති ගැටලු නිරීක්ෂණය කර 2023.01.01 දින සිට විශ්‍රාම ගන්නා නිලධරයන් සම්බන්ධයෙන් පහත විධි විධානයන් ක්‍රියාත්මක වන බව අවධාරණය කරමි.

(අ) වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි පත්වීම් දරන සෑම නිලධරයෙකුගේම පෞද්ගලික ලිපිගොනුවලට 2020.01.01 දින සිට වාර්ෂිකව එම දායක මුදල් අය වී ඇති බවට තොරතුරු ඇතුළත් කිරීම හා එපරිදි වාර්ෂිකව පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට සෑම ආයතන ප්‍රධානියෙකු විසින්ම කටයුතු කළ යුතු අතර මේ සඳහා "ඇමුණුම 01"හි ආකෘතිය භාවිත කිරීම.

(ආ) ද්විතීයන පදනම මත වන මුදාහැරීම්වල දී විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කර ගැනීම සඳහා ගෙවිය යුතු 25% හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම් සම්බන්ධ වාර්තා පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම.

(ඇ) වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි නිලධරයෙකුගෙන් තම සේවා කාලයට අදාළව දායක මුදල් ගෙවා නොමැති කාලයන් ඇති බවට අනාවරණය වන අවස්ථාවල දී (උදාහරණ: සේවා කඩවීම්, වැටුප් රහිත සේවා කාලයන් වැනි) එම දායක මුදල් අයකර ගැනීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම **01**

## "පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා"

<u>වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තරය</u>

1. නිලධරයාගේ නම :-
2. තනතුර :-
3. වැටුප් ගෙවන ලද කාලසීමාව :-
4. දායක මුදල් අයකළ කාලසීමාව:-
5. හිඟ දායක මුදලක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :-
6. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් පවතින විධිවිධාන අනුව වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් නිවැරදිව අයකර අදාළ ආදායම් ශීර්ෂයට බැර කර ඇති බවත් මෙයින් තහවුරු කරමි.

දිනය:- ..........................................................................

(ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී )

(නිල මුද්‍රාව)

පිටපත:- නිලධාරියා